## 2.22 ඝනකය හා පිරමිඩය අතර පරිමා සංසන්දන උපකරණය



හැඳින්වීම :- විනිවිද පෙනෙන ද්‍රව්‍ය වලින් සැදි සංවෘත සංයුක්ත වස්තුවක් වන මෙය ඝනකයක් හා ඒ මත වූ ඝනකයේ උසට සමාන උසක් ඇති පිරමිඩයකින් නිම වී ඇත. ඝනකය සමාන කොටස් තුනකට බෙදා ඇති අතර පිරමිඩයේ පරිමාවට සමාන පරිමාවක් ඇති ඝන ද්‍රව්‍යයකින් එය පුරවා ඇත.

භාවිත කළ හැකි අවස්ථා :-

| ශ්‍රේණිය | පාඩම | භාවිත කළ හැකි අවස්ථා |
|---|---|---|
| 11 | පිරමීඩ / කේතු / පරිමාව | සමචතුරස්‍ර පිරමීඩයක හා එහි පතුලට සමාන පතුලක් හා පිරමීඩයේ උසට සමාන උස ඇති කේතුවක පරිමාව අතර සම්බන්ධය හඳුනා ගැනීම |

ගුරු උපදෙස් :-

ඝනකයේ පතුළට සමාන පතුලක් ඇති පිරමිඩයක් බව, ඝනකයේ උසට සමාන උසක් ඇති පිරමිඩයක් බව සහ පිරමිඩයේ පරිමාව සහ ඝනකයේ පරිමාව අතර සම්බන්ධය ආදර්ශනය කර පෙන්වන්න.

සිසු උපදෙස් :-

පිරිමීඩයන් හා ඝනකයන් භාවිතයෙන් සකස් කර ඇති සංයුක්ත ඝන වස්තුවේ පිරිමීඩය ඝනකය මත පිහිටන ලෙස මේසය මත තබන්න.

1. ඝනකයේ ආධාරක මුහුණතේ දිග මැන වර්ග ඵලය සොයන්න.(ඝනකාභයක් නම් ආධාරක මුහුණත් දිග,පළල මැන වර්ග ඵලය සොයන්න.)
2. ඝනකයේ (ඝනකාභය)පමණක් පරිමාව ගණනය කරන්න.
3. ඝනකයේ (ඝනකාභය) ඇති ද්‍රව්‍යවල පරිමාව ගණනය කරන්න.(නිරීක්ෂණයෙන්)
4. පිරිමීඩයේ ලම්බ උස මනින්න.
5. පිරිමීඩයේ උසත් ඝනකයේ (ඝනකාභය) උසත් අතර සම්බන්ධය ලියන්න.
6. ඝනකයේ (ඝනකාභය) ඇති ද්‍රව්‍ය පිරිමීඩයට වැටෙන ලෙස සංයුක්ත ඝන වස්තුව කරකවා ඝනකයේ (ඝනකාභය) පරිමාවත් පිරිමීඩයේ පරිමාවත් අතර සම්බන්ධය ලියන්න.
7. පිරම්ඩයේ පරිමාව සෙවීම සඳහා සූත්‍රයක් ගොඩනගන්න.(පිරිමීඩයේ ආධාරක පාදයේ දිග a ද, ලම්බ උස h ලෙස ගන්න)